# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1885/31 - 2014 ඔක්තෝබර් මස 22 වැනි බදාදා - 2014.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1086/26 දරන හා 1999.07.02 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින්වර කරනු ලැබූ සංශෝධන අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී. එම්. එල් සී. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2014, ඔක්තෝබර් මස 21 වැනි දින.

01. **ක්‍රියාත්මක වන දිනය :**

මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2008.07.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

02. **පත්කිරීම් බලධරයා :**

2.1 ජාතික පාසල් හෝ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විදුහල්පති සේවයේ 1 පන්තියේ නිලධරයන් හා ජාතික පාසල්වල විදුහල්පතිවරුන්ගේ පත් කිරීම් බලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

2.2 ඉහත 2.1 ට අයත් නොවන විදුහල්පති 1, 2 හා 3 පන්තිවල පත්කිරීම් බලධරයා අධ්‍යාපන විෂයය භාර ජේෂ්ඨ අමාත්‍යාංශයේ ලේකම් වේ.

03. **සේවා ගණය/ සේවා ගණ :**

*3.1* සේවා ගණය : ශ්‍රී ලංකා විදුහල්පති සේවය

*3.2* පන්තිය - 3 පන්තිය
2 පන්තිය
1 පන්තිය


1A - PG 2211— 200 (2014/10)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

04. කාර්යය භාරය :

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි රේඛීය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්හි පාලනයට යටත්, රජයේ පාසල්වල අධ්‍යාපනයට අදාළ ජාතික මට්ටමේ හා අනෙකුත් විභාග පැවැත්වීමට අදාළව පවරනු ලබන කාර්යයන්, පාසල්වල ක්‍රීඩා හා අනෙකුත් විෂය සමගාමී කාර්යයන් සහ ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා දායක වීම පාසල් මඟින් ක්‍රියාත්මක කළ යුතු යැයි රජය විසින් තීරණය කරනු ලබන අධ්‍යාපනය සම්බන්ධ කාර්යයන් ද ඇතුළත්ව පාසල් පරිපාලනයට හා කළමනාකාරීත්වයට අදාළව ඉටුකළ යුතු සියලු කාර්යයන් විදුහල්පති සේවයේ නිලධාරීන් විසින් ඉටු කළ යුතු ය.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය - ජී. ඊ.-4 - 2006

5.2 වැටුප් පරිමාණය-
රු. 17,060 - 7x330 - 6x400 -11x645 -14x790 - රු.39,925

5.3 අදාළ පන්ති ක්‍රමය හා එක් එක් පන්තියට අදාළ ආරම්භක වැටුප් පියවර :

| පන්තිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| 3 | පියවර 1 | රු. 17,060 |
| 2 | පියවර 8 | රු. 19,370 |
| 1 | පියවර 15 | රු. 22,415 |

06. සේවයට අයත් තනතුරු :

6.1 සේවයට අයත් තනතුරු

<table>
<tr><th>අනුමත තනතුරු නාම</th><th>තනතුර අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>සහකාර විදුහල්පති</td><td>II ශ්‍රේණිය<br>III ශ්‍රේණිය</td><td>901<br>510</td><td rowspan="2">i. විදුහල්පතිවරයාගේ පාලනය හා අධීක්ෂණය යටතේ පාසල් පරිපාලනයට සහාය වීම.<br>ii. පාසල් මට්ටමින් පවත්වනු ලබන විභාග පැවැත්වීමට අදාළව පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම.<br>iii. ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට දායක වීම.<br>iv. පාසල්වල විෂය සමගාමී කාර්යයන් ඉටු කිරීම.<br>v. විදුහල්පති විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්.<br>vi. රජය විසින් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු යැයි තීරණය කරනු ලබන කාර්යයන් ඉටු කිරීම.</td></tr>
<tr><td>නියෝජ්‍ය විදුහල්පති</td><td>I ශ්‍රේණිය<br>II ශ්‍රේණිය<br>III ශ්‍රේණිය</td><td>1327<br>2495<br>1467</td></tr>
<tr><td>විදුහල්පති</td><td>I ශ්‍රේණිය<br>II ශ්‍රේණිය<br>III ශ්‍රේණිය</td><td>2205<br>2716<br>4891</td><td>i. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව පාසල් පරිපාලනය හා කළමනාකරණය නිසි පරිදි මෙහෙයවමින් අධ්‍යාපන බලධාරීන් විසින් පවරනු ලබන කාර්යයන් ඉටු කිරීම.<br>ii. පාසලේ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය, විෂය ඇගයීම් කටයුතු හා පාසලේ භෞතික සම්පත් මනාව පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම.</td></tr>
</table>

6.2 ඒකාබද්ධ තනතුරු සංඛ්‍යාව :

| ශ්‍රේණිය | සංඛ්‍යාව |
|---|---|
| I ශ්‍රේණිය | 3532 |
| II ශ්‍රේණිය | 6112 |
| III ශ්‍රේණිය | 6868 |

ඒකාබද්ධ නිලධාරීන් සංඛ්‍යාව – 16512

උසස්වීම් ලබා දීමේ දී III, II සහ I යන ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් ලෙස සලකනු ලැබේ.

සටහන : (i) සේවක සංඛ්‍යාව අධ්‍යාපන පද්ධතියේ අවශ්‍යතාවයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ කලින් කලට වෙනස් කරනු ලැබිය හැක.

(ii) අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ දී සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් ඇති පුරප්පාඩු සංඛ්‍යාව අනුව සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම වෙන් වෙන්ව බඳවා ගනු ලැබේ.

6.3 තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතයි.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නැත |
| සීමිත | 100% |

7.2 සීමිත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා පන්තිය : ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තිය

7.2.2 සුදුසුකම් :

පහත සඳහන් සුදුසුකම් තිබෙන සේවය ස්ථිර කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරු, සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

7.2.2.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය ;

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය

සමග

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ;

හෝ

ගුරු පුහුණු සහතිකය ;

හෝ

(iii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව/ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.

7.2.2.2 සළපුරුද්ද :

ඉහත 7.2.2.1 හි (i) හෝ (ii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් හෝ 7.2.2.1 හි (iii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර හයක (06) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු විම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

7.2.2.3 කායික හා මානසික යෝග්‍යතාවය :

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.2.2.4 වෙනත් :

(i) විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන තරග විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර නැත.
(ii) විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතු ය.
(iii) ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිරකර තිබිය යුතුය.

7.2.3 වයස : උපරිම වයස අවුරුදු 50 විය යුතු ය.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය :
ප්‍රශ්න පත්‍ර තුන (03) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. ලිඛිත විභාගය සඳහා විෂය නිර්දේශය "අ" පරිශිෂ්ටයේ ඇත.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|
| අවබෝධය | 100 | 40% |
| පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය | 100 | 40% |
| අභියෝග්‍යතාවය හා සාමාන්‍ය දැනීම | 100 | 40% |

පවත්වන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

7.2.4.3.1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

* ලිඛිත පරීක්ෂණයට ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එයින් සුදුසුකම් ලබන්නන් ව්‍යුහගත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : ඉහත 7.2.2 හි සඳහන් සුදුසුකම් හා බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා අදාල කුසලතා නිශ්චය කිරීම.

7.2.4.3.2 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

* විදුහල්පති කාර්ය භාරයට අදාල මාතෘකාවක් පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය.
ඒ සඳහා ලකුණු 25 ක් ලබා දෙනු ලැබේ.

(මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ක්‍රමය "අ" පරිශිෂ්ටයේ 4.2 හි සඳහන් වේ.)

7.2.4.4 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා -
අධ්‍යාපන විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්

7.2.4.5 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරියකු සභාපති ලෙස හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු, දෙමළ මාධ්‍ය නිලධාරියකු, අධ්‍යාපන අමාත්‍යාංශයට බාහිර ආයතනයක නිලධාරියකු අතරින් දෙදෙනෙකු ද, වශයෙන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විය යුතු ය.

සටහන : ඉහත ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා ලබා ගත් ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගත් අනුපිළිවෙලට පුරප්පාඩු පුරවනු ලැබේ.

7.2.5 විභාගයට පෙනී සිටීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ක්‍රමය හා අවශ්‍ය ගාස්තු ප්‍රමාණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ හෝ පුවත්පත්වල පළ කරනු ලැබේ.

08. **කාර්යක්ෂමතා කඩඉම :**

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම් ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලා/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට බඳවා ගෙන වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය "ආ" පරිශිෂ්ටය |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියට උසස් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය "ඇ" පරිශිෂ්ටය |

8.2 **පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද** - කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටත් පිරිසෙයින් වර්ෂයකට දෙවතාවක් පවත්වනු ලැබේ.

8.3 **පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා** - විභාග කොමසාරිස් ජනරාල්

09. භාෂා ප්‍රවීණතාවය :

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාව |
|---|---|
| අනෙක් රාජ්‍ය භාෂාව | රා. ප. ච. 01/2014 අනුව |
| සන්ධාන භාෂාව | සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර තුන (03)ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. නිලධාරියෙකු අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබේ නම් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් මෙහි "ඇ" පරිශිෂ්ටයේ සඳහන් පරීක්ෂණය සමත් විය යුතු ය. |

9.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද

යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වතාවක්වත් පවත්වනු ලැබේ

9.3 පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා - විභාග කොමසාරිස් ජනරාල්

10. ශ්‍රේණි උසස් කිරීම :

10.1 සේවයේ III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සපුරාලිය යුතු අවශ්‍යතා -

(i) සේවයේ ස්ථිරකර තිබීම
(ii) උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ 3 වන පන්තියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබිය යුතු අතර, වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබිය යුතු ය.
(iii) නියමිත දිනට 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබිය යුතු ය.
(iv) අනෙක් රාජ්‍ය භාෂාව සමත්ව හෝ ඉන් නිදහස් කරනු ලැබ සිටිය යුතු ය.
(v) සන්ධාන භාෂාව සමත් වී හෝ ඉන් නිදහස් කරනු ලැබ සිටිය යුතු ය.
(vi) අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතු ය.
(vii) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයේ වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබිය යුතු ය.
(viii) ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව I සමත්වී තිබිය යුතු ය.

10.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් පත්කිරීමේ බලධාරියා වෙත නියමිත ආකෘති පත්‍රයෙන් ඉල්ලුම් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2 වන පන්තියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍රය "ඉ" පරිශිෂ්ටයේ ඇත.

10.2 සේවයේ II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සපුරාලිය යුතු අවශ්‍යතා :

(i) උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ 2 වන පන්තියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය(06) ක් උපයාගෙන තිබිය යුතු ය.

(ii) නියමිත දිනට 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබිය යුතුය.
(iii) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයේ වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
(iv) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්නයේ වූ වසර හය (06) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබිය යුතුය.
(v) උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අධ්‍යාපනවේදී උපාධියක් සම්පූර්ණ කර තිබීම.
(vi) පාසල් කළමණාකරණ ඩිප්ලෝමාව (DSM) හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමණාකරණ ඩිප්ලෝමාව (PGDEM) සම්පූර්ණ කර තිබීම.
(vii) ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සමත්වී තිබිය යුතුය.

10.2.2 *උසස් කිරීමේ ක්‍රමය :*

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් පත්කිරීමේ බලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන පන්තියට උසස් කිරීම පත්වීමේ බලධරයා විසින් සිදුකරනු ලැබේ. ඉල්ලුම් කළ යුතු ආකෘති පත්‍රය "ඊ" පරිශිෂ්ඨයේ ඇත.

11. තනතුරුවලට පත්කිරීම :

| | තනතුර | තෝරාගනු ලබන ක්‍රමය |
|---|---|---|
| 01 | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ වන ජාතික පාසල්වලට හෝ ආයතනවලට අයත් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියේ නිලධරයන් සහ ජාතික පාසල්වල විදුහල්පතිවරුන් | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයින් 3 කින් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කරනු ලබන නිර්දේශය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.(රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටියකට අනුව මෙම නිර්දේශ කිරීම කරනු ලැබේ.) |
| 02 | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ වන ජාතික පාසල්වලට හෝ ආයතනවලට අයත් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 හා 3 පන්තියේ නිලධරයන් සහ ජාතික පාසල්වල නියෝජ්‍ය, සහකාර විදුහල්පතිවරුන් | ඉල්ලුම් කරන නිලධාරීන්ගේ සේවයේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාව අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලැබේ. |
| 03 | පළාත් පාසල්වල විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති | ඉල්ලුම් කරන නිලධාරීන්ගේ සේවයේ ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය අනුව පළාත් බලධාරීන් විසින් පත්කරනු ලැබේ. |

12. සේවයට අදාල කොන්දේසි :

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ජාතික පාසල්වල හා පළාත් සභා පාසල්වල අනුමත තනතුරුවල සේවය කිරීමට යටත් වන්නේය. මෙහිදී පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීම සඳහා තෝරා ගනු ලබන නිලධාරියා අදාළ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීම සඳහා තාවකාලිකව මුදාහරිනු ඇත. එසේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාවය, කාර්ය මණ්ඩල යෙදවීමේ අවශ්‍යතාවය සහ වෙනත් අදාළ කරුණු අනුව අදාළ පළාත් බලධාරියා සහ පත්කිරීමේ බලධරයා අතර ඇති කරගනු ලබන එකඟතාව මතය.

(i) සේවයෙන් මුදාහැරීමේ කොන්දේසිවලට යටත්ව පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීමේ ලිපියක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියා වෙත නිකුත් කරනු ඇත.
(ii) අදාළ පළාත් බලධාරීන් විසින් පළාත තුළ ස්ථානගත කිරීම හා ස්ථාන මාරු කිරීම් කරනු ඇත.
(iii) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහරින ලද කාලය අවසානයේදී නිත්‍ය සේවයට ආපසු පැමිණිය යුතුය.

13. නිපුණතා සංවර්ධනය :

13.1 සේවාරම්භක පුහුණුව :

මෙම සේවයට බඳවාගනු ලබන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සෑම නිලධාරියෙකුම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලබන පුහුණු ආයතනයක් මගින් පාසල් කළමනාකරණය පිළිබඳ සේවාරම්භක කිරීමේ මාස 01 ක පුහුණුව සම්පූර්ණ කළ යුතු අතර පුහුණුව අවසානයේ පවත්වන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතු අතර සමත් වීමට අපොහොසත් වන නිලධාරීන් ඔවුන් කලින් සිටි සේවය වන ශ්‍රී ලංකා ගුරු සේවයට ආපසු යැවීමට කටයුතු කරනු ලැබේ. (මෙම ප්‍රායෝගික පරීක්ෂණයේදී තෝරාගත් මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර ඒ සඳහා ලකුණු ලබා දෙන ක්‍රමය "අ" පරිශිෂ්ටයේ 4. 2 සඳහන් වේ.)

13.2 ධාරිතා සංවර්ධනය :

13.2.1 ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 1 :

සෑම නිලධාරියෙක්ම විදුහල්පති සේවයට පත්වී වසර 06ක් තුළ රේඛීය අමාත්‍යාංශයේ අධ්‍යාපන ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන මාස 01ක ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 1 සමත් විය යුතුය.

13.2.2 ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 :

සෑම නිලධාරියෙක්ම විදුහල්පති සේවයේ II ශ්‍රේණියට උසස්වී වසර 06ක් තුළ රේඛීය අමාත්‍යාංශයේ අධ්‍යාපන ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන මාස 01 ක ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සමත් විය යුතුය.

14. අර්ථ නිරූපන හා නිර්වචන :

(i) "ගැසට් පත්‍රය" යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

(ii) "සේවා ව්‍යවස්ථාව" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවයි.

(iii) "කොමිෂන් සභාව" යන පදයෙන් අදහස් කෙරෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි.

(iv) "සක්‍රීය සේවා කාලය" යනුවෙන් අදහස් කරන්නේ ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රජයේ පාසලක රාජකාරියේ යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

(v) "ලේකම් " යනුවෙන් අදහස් කරනුයේ අධ්‍යාපන විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වේ.

(vi) "සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවය යි.

(vii) "අමාත්‍යාංශය" යනුවෙන් අදහස් කරනුයේ අධ්‍යාපන විෂයභාර රේඛීය අමාත්‍යාංශය වේ.

(viii) "ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව" යනු අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන විද්‍යා පීඨයකින් ලබා ගන්නා ලද ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව වේ.

(ix) "ගුරු පුහුණු සහතිකය" යනු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දෙවසරකට නොඅඩු වූ ආයතනික ගුරු පුහුණු පාඨමාලාවක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දුරස්ථ ක්‍රමය මගින් හදාරන ලද තෙවසරකට නොඅඩු ගුරු පුහුණු පාඨමාලාවක් වේ.

15. සේවයට බඳවා ගැනීමේදී යම් වර්ෂයක දී බඳවා ගත යුතු සංඛ්‍යාව, එම වර්ෂයේ ජුනි 30 දිනට සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් විය යුතුය.

16. මෙම ව්‍යවස්ථාවේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවයන් ද සියලු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබා ගත යුතුය.

17. **සේවයේ සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම :**

17.1 සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ වන ශ්‍රේණි ව්‍යුහයට අන්තර්ග්‍රහණය කිරීම 2010.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි උප ලේඛන 11 යටතේ සිදු කරන අතර ඊට අදාළ නිග වැටුප් ගෙවීම 2010.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2010 හි 2. 3 අනුව සිදු කරනු ලැබේ.

17.2 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් ප්‍රතිසංවිධිත ශ්‍රී ලංකා විදුහල්පති සේවයට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප්පෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4. 4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

17.3 මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විට සේවයේ නියුතුව සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට ළඟා නැති නිලධරයකු හට ඔහු විසින් කරනු ලබන ඉල්ලීමක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වන වගන්තිය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දිය යුතුය. එවන් සහනයක් පිරිනැමිය යුතු තරමට මෙම සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලින් අහිතකර බලපෑමක් එම නිලධරයාට ඇති වී ඇතැයි රාජ්‍ය සේවා කොමිසන් සභාව සෑහීමකට පත්වන්නේ නම් මෙම සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන දින සිට අවුරුදු 2 ක් තුළ ඔහු/ ඇය ට එම මනාපය පළ කළ හැක.

17.4 *අන්තර්ග්‍රහණය කිරීමේ පටිපාටිය :*

17.4.1 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ සියලුම නිලධාරීන් සේවයේ 3 වන පන්තියට ද,

17.4.2 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ සියලුම නිලධාරීන් සේවයේ 2 වන පන්තියට ද,

17.4.3 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියේ සිටින පෙර සේවා ව්‍යවස්ථාවට අනුව 2008.07.01 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියට උසස්වීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සේවයේ I වන පන්තියටද, අනෙකුත් 2 පන්තියේ I ශ්‍රේණියේ සියලුම නිලධාරීන් සේවයේ 2 වන පන්තියට ද,

17.4.4 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වන පන්තියේ සිටින සියලුම නිලධාරීන් සේවයේ I වන පන්තියටද, අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

17.5 අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව මෙම ව්‍යවස්ථාව යටතේ උසස්වීම් ලබා දීමේ දී අවශ්‍ය සේවා කාලය ගණනය කිරීම සඳහා අන්තර්ග්‍රහණයට පෙර සිටි විදුහල්පති සේවයේ පන්තියේ / ශ්‍රේණියේ සේවා කාලය ද ගණන් ගනු ලැබේ.

17.6 අන්තර්ග්‍රහණය කිරීම මත වැටුප සකස් කිරීම රාජ්‍ය චක්‍රලේඛ අංක 6/2006 (viii) පරිදි සිදු කළ යුතුය.

17.7 අන්තර්ග්‍රහණය හේතු කොටගෙන වැටුප් වර්ධක දිනය වෙනස් නොවේ.

18. **අන්තර්කාලීන විධිවිධාන :**

අන්තර්කාලීන විධිවිධාන 2016.01.01 දින දක්වා බල පැවැත්වේ.

18.1 ***අන්තර්කාලය තුළ උසස් කිරීම.***

18.1.1 *II වන ශ්‍රේණියට උසස් කිරීම :*

අන්තර්කාලය තුළ දී 3 පන්තියේ නිලධාරීන් II වන ශ්‍රේණියට උසස් කිරීමේ දී අංක 1086/26 දරන හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත්ව ඇති නිලධාරීන් මෙම ව්‍යවස්ථාවේ සඳහන් වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය 1 සමත්වීමේ හා ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 1 සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර 10. 1. 1 හි සඳහන් අනෙකුත් සුදුසුකම් සපුරන දිනට II වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

18.1.2 *I ශ්‍රේණියට උසස් කිරීම :*

අංක 1086/26 දරන හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම සමත්, I පන්තියට උසස්වීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරන නිලධාරීන්, මෙම ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම 1 හා 2 සමත්වීමේ අවශ්‍යතාවයෙන් හා ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලා 1 හා 2 සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර 10. 2. 1 හි (v) හා (vi) හැර අනෙකුත් සුදුසුකම් සපුරන දිනට I වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

I ශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම ව්‍යවස්ථාවේ 9. 1 ට අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව හා සන්ධාන භාෂා ප්‍රවීණතාවය ලබා තිබිය යුතුය.

19. මෙම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ අංක 1589/30 හා 2009.02.20 දිනැතිව ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට සේවයේ සෑම නිලධාරියෙකුම යටත් වේ .

20. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

'අ' පරිශිෂ්ටය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන සීමිත තරග විභාගය පිළිබඳ විස්තර.

01. ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| | | | |
|---|---|---|---|
| (i) | අවබෝධය | - | ලකුණු 100 යි |
| (ii) | පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය | - | ලකුණු 100 යි |
| (iiii) | අභියෝගතාවය හා සාමාන්‍ය දැනීම | - | ලකුණු 100 යි |

02. **විෂය නිර්දේශය :**

(i) *අවබෝධය* - පැය 01 1/2 යි.

පාඨ කිහිපයක අර්ථය වටහා ගැනීමට අපේක්‍ෂකයා සතු ශක්තිය මැන ගැනීම සඳහා සහ සාරාංශගත කිරීම පිළිබඳ අවබෝධය මැන බැලීම සඳහා ප්‍රශ්න සකස් කරනු ලැබේ.

(ii) *පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය* - පැය 02 යි.

පාසල් හා කළමනාකරණය තුළ ඇති විය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර, එම සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීම හා ගැටලු නිරාකරණය පිළිබඳව අපේක්‍ෂකයින්ගේ අදහස් මතු කර ගැනීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

(iii) *අභියෝගතාවය හා සාමාන්‍ය දැනීම* - පැය 01 1/2 යි

ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්‍ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු

සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්‍ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්‍ෂා කෙරේ.

* සෑම විෂයයකින්ම සමත්වීම සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් 40%ක් ලබා ගත යුතු ය.

03. (අ) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර නොමැත.

(ඇ) සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර තුනටම පෙනී සිටිය යුතු ය.

04. සම්මුඛ පරීක්ෂණය :

4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්‍ෂණයට ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ. එයින් සුදුසුකම් ලබන්නන් ව්‍යුහගත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

4.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

විදුහල්පති කාර්ය භාරයට අදාල මාතෘකාවක් ඔස්සේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. ඒ සඳහා ලකුණු 25ක් ලබා දෙනු ලැබේ.

ඉදිරිපත් කිරීම සඳහා ලකුණු ලබා දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1. හැඳින්වීම | - | ලකුණු 04 |
| 2. ඉදිරිපත් කිරීමේ සැලැස්ම | - | ලකුණු 04 |
| 3. ඉදිරිපත් කිරීමේ කුසලතාව | - | ලකුණු 08 |
| 4. විෂය දැනුම | - | ලකුණු 05 |
| 5. කාල කළමනාකරණය | - | ලකුණු 04 |

"ආ" පරිශිෂ්ටය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වැනි පන්තිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්‍ෂණය

01. සේවයේ 3 වන පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් වන විෂයයන්ගෙන් සමන්විත වේ.

(i) ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - ලකුණු 100 යි

(iii) පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි - ලකුණු 100 යි

02. නිලධාරියෙකුට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

03. සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් 40%ක් ලකුණු ලබා ගත යුතු ය.

04. විෂය නිර්දේශය

(i) ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති - කාලය පැය 02 යි

ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, VIII, IX, X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්‍ෂා කරනු ලැබේ.

(ii) පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි - කාලය පැය 02 යි.

අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිතා වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ වේතන, රාජකාරි දුරකථන පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ.

05 (අ) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම් පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර නොමැත.

"ඇ" පරිශිෂ්ටය

***ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2වන පන්තිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය***

01. සේවයේ 2 වැනි පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන් වන විෂයයන්ගෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| (i) | පාසල් පරිපාලනය හා අධීක්ෂණය | - ලකුණු 100 යි |
| (ii) | පාසල් සැලසුම්කරණය | - ලකුණු 100 යි |
| (iii) | අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර | - ලකුණු 100 යි |

02. නිලධාරියෙකුට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

03. සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකටම අවම වශයෙන් 40%ක් ලකුණු ලබා ගත යුතු ය.

04. විෂය නිර්දේශය :

(i) පාසල් පරිපාලනය හා අධීක්ෂණය - කාලය පැය 03 යි.

පාසලක යහපාලනය සඳහා විදුහල්පතිවරයෙකුගේ කාර්ය භාරය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කෙරේ. පාසල් කළමනාකරණ ක්‍රමවේද, කාලසටහන් සැකසීම, වගකීම් බෙදා දීම, පාසල් සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය, පාසල් පාදක කළමනාකරණය, පාසල් පාදක ගුරු සංවර්ධනය, ගුරු සුභසාධනය, ශිෂ්‍ය හිතකාමී පාසල් සංකල්පය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(ii) පාසල් සැලසුම්කරණය - කාලය පැය 03 යි.

සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයෙකුගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ. පාසල් කළමනාකරණ මණ්ඩල, පාසලක දැක්ම හා මෙහෙවර, පාසල් තොරතුරු පාදක සැකසීම, සංයුක්ත සැලසුම්, දීර්ඝ කාලීන හා කෙටි කාලීන සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්, පාසල් ශාල හා සම්පත් සැලසුම් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට පාසලේ දායකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ.

(iii) අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර - කාලය පැය 03 යි

ඉගෙනීම හා ඉගැන්වීම පිළිබඳ නව සංකල්පය, අන්දැකීමෙන් ඉගෙනීම, තර්කානුකූල චින්තනය, අධ්‍යාපනයේ සමතාව, විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නිපුණතා පාදක අධ්‍යාපනය, ජීවත්වීම සඳහා අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන හා වෘත්තීයමය මාර්ගෝපදේශන යන විෂය කරුණු පිළිබඳව දැනුම මැන බැලේ.

05 (අ) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

"ඈ" පරිශිෂ්ටය

ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්‍ෂණය

01. ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්‍ෂණය එක් ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

(i) ඉංග්‍රීසි - ලකුණු 100 යි

02. සාමාර්ථය සඳහා මෙම ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතු ය.

03. විෂයය නිර්දේශය :

General English – Time 03 hours

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate :-

- Tenses and Numbers
- Sentences (Simple/ Compound/ Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The knowledge on the modern formats and styles of writing is tested in following area of study :-

- Summary writing
- Report writing
- Essay writing

"ඉ" පරිශිෂ්ටය

ආදර්ශ අයදුම් පත්‍රය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ **III** වන ශ්‍රේණියේ නිලධාරීන් **II** වන ශ්‍රේණියට උසස් කිරීම.

*I* කොටස

1. (අ) මුලකුරු සමග නම : .................................................................... මියා/මිය/මෙනවිය.
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම : ....................................................................
   (ඇ) නම වෙනස් කළේ නම් මීට පෙර භාවිතා කරන ලද නම : ....................................................................
   (නම වෙනස් කර ඇත්නම් පමණි)
2. උපන් දිනය : ....................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................
4. පෞද්ගලික ලිපිනය : ....................................................................
5. දැනට සේවය කරන විදුහල : ....................................................................
6. දැනට දරන තනතුර : ....................................................................
7. විදුහල අයත් කලාපය : ....................................................................
8. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වැනි පන්තියේ/ III වන ශ්‍රේණියේ පත්වීම් දිනය : ....................................
9. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වැනි පන්තියේ/ III වන ශ්‍රේණියේ පත්වීම් ලිපියේ අංකය :
   දිනය : ..........................
10. පත්වීම ස්ථිර කළ දිනය : ....................................................

11. I වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය : ..........................................................................
12. III වන ශ්‍රේණියේ වසර හය (06) ක් සම්පූර්ණ වූ දිනය : ..........................................................................
13. උසස්වීමේ පූර්වාසන්න වසර හය (06) තුළ පෙන්නුම් කර ඇති කාර්යය සාධන මට්ටම :

| වර්ෂය | කාර්යය සාධන මට්ටම |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

14. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව I සමත්වූ දිනය :..........................................................................
15. අනෙක් රාජ්‍ය භාෂාව සමත් වූ දිනය හෝ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ දිනය :..........................................
එම ලිපියේ යොමු අංකය හා දිනය :..........................................................................
16. සන්ධාන භාෂාව සමත් වූ දිනය හෝ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ දිනය :
එම ලිපියේ යොමු අංකය හා දිනය :..........................................................................
මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව සහතික කරමි. මෙහි සඳහන් කර ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා උසස් කිරීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවටත්, උසස් කිරීමෙන් පසු හෙළිදරව් වුවහොත් උසස් වීම අවලංගු කිරීමට යටත් බවටත් මම එකඟ වෙමි. .............................. දින සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

දිනය : ..................................................

..................................................................
අයදුම්කරුගේ අත්සන

II කොටස

..................................................................කලාප් අධ්‍යාපන අධ්‍යක්ෂ,

..........................................................................මහතා/ මහත්මිය/මෙනවියගේ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදිය.

(i) .................................................. දිනට වසර හය (06)ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/නැත
(ii) උසස් වීම පූර්වාසන්න වසර හය (06) තුළ සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත
(iii) එම වසර හය (06) තුළ අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු ලබා නොමැත/ඇත
(iv) එම කාලය තුළ අවවාද කිරීමක් හැර කිසිම දඬුවමකට යටත් කර නොමැත/ඇත
(v) නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධව විනය කටයුතු කිසිවක් නොමැත/ඇත
(vi) අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇත/නැත
(vii) .................................................. දින සිට පත්වීම ස්ථිර කර ඇත/නැත
(viii) I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇත/නැත
(ix) ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලා I සමත්වී ඇත/නැත
(x) අනෙක් රාජ්‍ය භාෂාවෙන් සමත්වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ඇත / නැත
(xi) සන්ධාන භාෂාවෙන් සමත්වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ඇත / නැත

මෙම නිලධාරියා / නිලධාරිනිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බැවින් .............................. දින සිට සේවයේ II වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය : ..................................................

..................................................................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

පළාත් අධ්‍යාපන ලේකම්,

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියේ ............................................නිලධාරියා / නිලධාරිනිය .............................................. දින සිට සේවයේ II වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය : ..........................................

..................................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

---

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියේ ............................................නිලධාරියා / නිලධාරිනිය .............................................. දින සිට සේවයේ II වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය : ..........................................

..................................................
පළාත් අධ්‍යාපන ලේකම්.

"ඊ" පරිශිෂ්ටය

***ආදර්ශ අයදුම් පත්‍රය***

***ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ IIවන ශ්‍රේණියේ නිලධාරීන් Iවන ශ්‍රේණියට උසස් කිරීම***

*I කොටස*

1. (අ) මුලකුරු සමග නම : ........................................................................................ මයා/මිය/මෙනවිය
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම : ...............................................................................
   (ඇ) නම් වෙනස් කලේ නම් මීට පෙර භාවිතා කරන ලද නම: ...................................................
   (නම් වෙනස් කර ඇත්නම් පමණි)
2. උපන් දිනය : ..................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................
4. පෞද්ගලික ලිපිනය : ...........................................................................................
5. දැනට සේවය කරන විදුහල : ...................................................................................
6. දැනට දරන තනතුර : ..........................................................................................
7. විදුහල අයත් කලාපය : .......................................................................................
8. සේවයේ මුල් පත්වීම ලද පන්තිය හා දිනය : .............................................................
   පත්වීම ස්ථිර කළ දිනය ..............................................
9. සේවයේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ හෝ උසස්වීම් ලද දිනය : ..................................
   ලිපියේ අංකය : ..............................................
10. 1 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දින හා විභාග අංකය : .................................................
11. 2 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දින හා විභාග අංකය : .................................................
12. සේවයේ II වන ශ්‍රේණියේ වසර හය (06)ක් සම්පූර්ණ වූ දිනය : ...............................................
13. උසස්වීමේ පූර්වාසන්න වසර හය (06) තුළ පෙන්නුම් කර ඇති කාර්යය සාධන මට්ටම:-

| වර්ෂය | කාර්යය සාධන මට්ටම |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

14. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 2 සමත්වූ දිනය :- ..........................................................................

15. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ අධ්‍යාපනවේදී උපාධිය සමත් වූ දිනය :- ......................................

16. පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වූ දිනය :- ......................................

17. අනෙක් රාජ්‍ය භාෂාව සමත් වූ දිනය හෝ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ දිනය :............................
එම ලිපියේ යොමු අංකය හා දිනය :-..........................................................................................

18. සන්ධාන භාෂාව සමත් වූ දිනය හෝ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ දිනය :
එම ලිපියේ යොමු අංකය හා දිනය :-..........................................................................................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදිවූත් ඒවා බව සහතික කරමි. මෙහි සඳහන්කර ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා උසස් කිරීමට පෙර හෙළිදරව් වුවහොත්, මා නුසුදුස්සකු වීමට යටත් බවටත්, උසස් කිරීමෙන් පසු හෙළිදරව් වුවහොත්, උසස් වීම අවලංගු කිරීමට යටත් බවටත් මම එකඟ වෙමි. .................................................. දින සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

දිනය :- ..............................................

..............................................................
අයදුම්කරුගේ අත්සන.

*II කොටස*

..................................................පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.

......................................................මහතා/ මහත්මිය/මෙනවියගේ ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි ය.

(i) ............................... දිනට II වන ශ්‍රේණියේ වසර හය (06)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණකර ඇත / නැත.
(ii) උසස් වීම් පූර්වාසන්න වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත/නැත.
(iii) එම වසර හය (06) තුළ අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු ලබා ඇත/නොමැත.
(iv) එම කාලය තුළ අවවාද කිරීමක් හැර කිසිම දඬුවමකට යටත් කර ඇත/නොමැත.
(v) නිලධාරියාට / නිලධාරිනියට විරුද්ධ විනය කටයුතු කිසිවක් ඇත/නොමැත.
(vi) අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇත/නැත.
(vii) .........................................දින සිට පත්වීම ස්ථිරකර ඇත/නැත.
(viii) 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇත/නැත.
(ix) 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී ඇත/නැත.
(x) ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව 11 සමත් වී ඇත/නැත.
(xi) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ අධ්‍යාපනවේදී උපාධිය සමත් වී ඇත/නැත.
(xii) පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වී ඇත/නැත.
(xiii) අනෙක් රාජ්‍ය භාෂාවෙන් සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ඇත / නැත.
(xiv) සන්ධාන භාෂාවෙන් සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කර ඇත / නැත.

මෙම නිලධාරියා / නිලධාරිනිය ........................................................ දින සිට සේවයේ I වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය :- ..............................................

..............................................................
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.

පළාත් අධ්‍යාපන ලේකම්,

මෙම නිලධාරියා /නිලධාරිනිය ................................................ දින සිට සේවයේ I වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය :- ..............................................

..........................................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ.

---

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

මෙම නිලධාරියා / නිලධාරිනිය ................................................ දින සිට සේවයේ I වන ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය :- ..............................................

..........................................................
පළාත් අධ්‍යාපන ලේකම්.

11-92

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2—PG 2211

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/59 - 2017 පෙබරවාරි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

පළමුවැනි සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 දරන හා 2014.10.22 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 දෙසැම්බර් මස 27 වැනි දින.

| වගන්තිය | ඡේද අංකය | සංශෝධනය |
|---|---|---|
| 17 | 17.4.3 | (අ) මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ 1 ශ්‍රේණියේ සිටින පෙර සේවා ව්‍යවස්ථාව අනුව 2008.07.01 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියට උසස්වීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියටද<br>(ආ) මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ 1 ශ්‍රේණියේ සිටින පෙර සේවා ව්‍යවස්ථාව අනුව 2008.07.01 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියට උසස් වීමට සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් පහත දක්වෙන කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියටද අන්තර්ග්‍රහණය කරනු ලැබේ.<br>I. මෙම නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය 2008.07.01 දිනට 1 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන අනෙකුත් සියලුම නිලධාරීන්ට වඩා පහළින් විය යුතු ය.<br>II. මෙම නිලධාරීන්ට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියේ වැටුප පමණක් ලබා ගත හැකි ය.<br>III. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 පන්තියේ විදුහල්පතිවරුන් සඳහා වන කුසලතා/සීමිත ධාරාවන් යටතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන/ගුරු අධ්‍යාපනඥ සේවයට උසස් වීම සඳහා සුදුසුකම් ලබන්නේ 2008.06.30 දිනට පැවති සේවා ව්‍යවස්ථාව යටතේ 1 ශ්‍රේණියට උසස් වීම සඳහා අවශ්‍ය සේවා කාලය ඇතුළුව අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරන ලද දිනයේ සිටය.<br>සටහන :- 2008.06.30 දිනට පැවති සේවා ව්‍යවස්ථාව යටතේ 2 වන පන්තියේ 1 ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හෝ නව සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම, වැටුප හැර අනෙකුත් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අනිවාර්යය වේ. |

02 - 709


1A - PG 3384 — 157 (2017/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2076/14 - 2018 ජූනි මස 19 වැනි අඟහරුවාදා - 2018.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## 1 වැනි කොටස : (I) ඡේදය-සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය**
**දෙවන සංශෝධනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 දරන හා 2014.10.22 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි

එම්.ඒ.බී.දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ජූනි මස 13 වැනි දින.


1A - G 27897– 08 (2018/06)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අනු අංකය ඡේද අංකය සංශෝධනය විය යුතු ආකාරය

01 18 18. අන්තර්කාලීන විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන 2020.10.22 දින දක්වා බල පැවැත්වේ.

**18. 1 අන්තර්කාලය තුළ උසස් කිරීම**

**18.1.1 II වන ශ්‍රේණියට උසස් කිරීම**

අන්තර්කාලය තුළ දී 3 පන්තියේ නිලධාරීන් II වන ශ්‍රේණියට උසස් කිරීමේ දී අංක 1086/26 දරන හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව ඇති නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 1 සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර 10.1.1හි (vii) හැර සඳහන් අනෙකුත් සුදුසුකම් සපුරන දිනට II වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

සටහන

i. අන්තර්කාලය තුළදී III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් සඳහා 18.1.1 යටතේ සඳහන් විධිවිධානයන් අදාළ නොවන අතර එම නිලධාරීන් II ශ්‍රේණියට උසස් වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ඇතුළු 10.1.1 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතුයි.

**18.1.2. I ශ්‍රේණියට උසස් කිරීම**

අංක 1086/26 හා 1999.07.02 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් සමත්, 1 පන්තියට උසස් වීමට අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරන නිලධාරීන් මෙම ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් 1 හා 2 සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර 10.2.1 හි (v), (vi) හා (vii) හැර අනෙකුත් සුදුසුකම් සපුරන දිනට 1 වන ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1 ශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාවේ 9.1ට අනුව රාජ්‍ය භාෂා පරීක්ෂණය සම්පූර්ණ කළ යුතුයි.

සටහන

1. අන්තර්කාලය තුළදී II ශ්‍රේණියට උසස් වන නිලධාරීන් සඳහා 18.1.2 යටතේ සඳහන් විධිවිධානයන් අදාළ නොවන අතර එම නිලධාරීන් I ශ්‍රේණියට උසස් වීම සඳහා මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ඇතුළු 10.2.1 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතුයි.

ii. 2007.07.01 දිනට පසුව විදුහල්පති තනතුරට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා අනුශංගික චක්‍රලේඛ මගින් නියම කරනු ලැබ ඇති රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය.

මෙම සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 9.1 යටතේ දක්වා ඇති සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

07-68

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/18 - 2020 දෙසැම්බර් මස 30 වැනි බදාදා - 2020.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය**

තුන්වැනි සංශෝධනය

2018 ජුනි මස 19 දිනැති, අංක 2076/14, 2017 පෙබරවාරි 02 දිනැති, අංක 2004/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත 2014 ඔක්තෝබර් මස 22 දිනැති හා අංක 1885/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 දෙසැම්බර් මස 21 වැනි දින,

| අනු අංකය | ඡේද අංකය | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 1. | 7.2.2.4 | (iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය |
| 2. | 10.1.1 | (vii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය |
| 3. | 10.2.1 | (iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය<br>අනු අංක (v) හා (vi) යටතේ ඇතුළත් සුදුසුකම් වෙනුවට පහත සඳහන් සුදුසුකම් ඇතුළත් කරනු ලැබේ.<br>(v) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට අවම වශයෙන් පහත සඳහන් එක් සුදුසුකමක් හෝ සම්පූර්ණ කර තිබීම.<br>(අ) අධ්‍යාපනවේදී උපාධිය<br>(ආ) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව<br>(ඇ) පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව<br>(ඈ) පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව |

01 - 88

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2255/55 - 2021 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා - 2021.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය**

සිව්වන සංශෝධනය

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් 22 දිනැති හා අංක 1885/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,

**I කොටස**

| | |
|---|---|
| සංශෝධන අංක 01 | - 2017 පෙබරවාරි 02 දිනැති හා අංක 2004/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 02 | - 2018 ජූනි 19 දිනැති හා අංක 2076/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 03 | - 2020 දෙසැම්බර් 30 දිනැති හා අංක 2208/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* |


1A - G35446 - 15 (2021/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II කොටස**

7.2.2.1 (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය ලබා තිබීම,

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය සමඟ පහත සඳහන් එක් හෝ සුදුසුකමක් ලබා තිබීම.

(අ) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ විෂය සංයුතියෙහි "අධ්‍යාපන විෂය" පිළිබඳව අවම වශයෙන් 50%ක් අන්තර්ගතවන විෂයානුබද්ධ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක්,

(ආ) ගුරු පුහුණු සහතිකය,

(ඇ) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව,

හෝ

(iii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව / ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.

7.2.2.2 ඉහත 7.2.2.1 හි (i) හෝ (ii) හි සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර පහ (05)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් හෝ 7.2.2.1 හි (iii) හි සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර හය (06)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

12.1 **ස්ථිර කිරීමේ කොන්දේසි**

12.1.1 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරියකු වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වනු ඇත.

12.1.2 සේවාරම්භක පුහුණුව සම්පූර්ණ කර ඇති හා වැඩ බැලීමේ කාලය තුළ තම රාජකාරී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ඇති නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථිර කරනු ලැබේ.

12.2 **මුදාහැරීමේ කොන්දේසි**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ජාතික පාසල්වල හා පළාත් සභා පාසල්වල අනුමත තනතුරුවල සේවය කිරීමට යටත් වන්නේ ය. මෙහිදී පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීම සඳහා තාවකාලිකව මුදාහරිනු ඇත. එසේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාවය, කාර්ය මණ්ඩල යෙදවීමේ අවශ්‍යතාවය සහ වෙනත් අදාළ කරුණු අනුව පළාත් බලධාරියා සහ පත්කිරීමේ බලධරයා අතර ඇති කරගනු ලබන එකඟතාවය මතය.

(i) සේවයෙන් මුදාහැරීමේ කොන්දේසිවලට යටත්ව පළාත් රාජ්‍ය සේවයට මුදාහැරීමේ ලිපියක් පත්වීම් බලධරයා විසින් අදාළ නිලධාරියා වෙත නිකුත් කරනු ඇත.

(ii) අදාළ පළාත් බලධාරීන් විසින් පළාත තුළ ස්ථානගත කිරීම හා ස්ථාන මාරුකිරීම් කරනු ඇත.

(iii) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදාහරිනු ලැබූ නිලධාරියෙකු එම පළාත් සභාවෙන් පිටතට ස්ථාන මාරු කිරීම පළාත් බලධාරීන්ගේ සහ පත්වීම් බලධරයාගේ එකඟතාවය අනුව සිදුකරනු ලැබේ.

12 - 218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.